# ගම්බැදි දේවකාරිය
# හෙවත්
# ගමේ මහාදන මංගල්ලය

[ඡායාරූප සඳහා 144 සිට 146 පිටු බලන්න]

**වසන්ත කේ දිසානායක***

සොබාදහමේ අපූර්වතම ක්‍රියාකාරිත්වය හා එය තමාගේ දෛනික අවශ්‍යතා සඳහා යොදාගැනීම සම්බන්ධයෙන් කිසියම් විද්‍යාත්මක මෙන්ම තාක්ෂණික දැනුමක් ආදිතම මිනිසා සතුව පැවති බව Bronislaw Malinowski පෙන්වා දෙයි[1]. මෙකී ඥානය පාදක කොට ගෙන මසුන් මැරීම, ධාන්‍ය ලබාගැනීම වැනි තමන්ට අභිමත කටයුතු සිදුකර ගත්ත ද, තමන් කිසිසේත් ම බලාපොරොත්තු නැති කිසියම් මොහොතක තමන් දන්නා වූ උපක්‍රමවලින් අභිමත ප්‍රතිඵල නොලැබී යා හැකිය. එවන් අවස්ථාවල දී ආදි යුගයේ පටන් ම මිනිසා සිදුකොට ඇත්තේ කිසියම් අභිචාරමය ක්‍රියාදාමයක පිහිට පැතීම ය. අව්ව, වැස්ස, නියගය, ගංවතුර, වසංගත පැතිරීම, ඍතු විපර්යාස වැනි සොබා දහමේ අපූර්වත ම ක්‍රියාකාරකම් ගැන සැක බිය පහළ කරගත් ඔවුහු සිය පෞද්ගලික ආරක්ෂාවට මෙන්ම පොදුවේ සමස්ත සමාජයේ ම ආරක්ෂාවට ද විවිධ අභිචාරමය ක්‍රියාදාමයන් හි යෙදෙන්නට වූහ. පොදුවේ සලකන විට මෙකී අභිචාර විධි මගින් ආරක්ෂාව මතු නොව පවිත්‍රත්වය, ගාම්භීරත්වය හා ජයග්‍රහණය පිළිබඳ දැඩි විශ්වාසයක් මෙන්ම පෞද්ගලික හා සමාජ කටයුතුවල දී ද ඉතාමත් ම වැදගත්වන්නා වූ නිසිකලට වේලාවට කටයුතු කිරීමේ සංවිධානාත්මක භාවය ගොඩනැගීමට ද මහෝපකාරී වේ.

අභිචාර විධි, අනුකරණ හා මන්ත්‍ර ගුරුකම් වශයෙන් හඳුන්වන James George Fraser, මෙකී මන්ත්‍ර ගුරුකම්, අනවින හදි හූනියම් ආදිය හානිදායක කටයුතු සඳහා මෙන්ම සෙත් ශාන්තිය, යහපත සඳහා ද, ලොව පුරා ජනතාව යොදාගන්නා බව ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි[2]. දැඩි නියඟයක දී වැස්ස අනුකරණය කිරීම, දඩයමේ දී සතුන් හසුනොවූ විට සතෙකු දඩයම් කිරීම අනුකරණය කිරීම, දරුවන් නැති මව්වරුන් දරුවන්ගේ ආකෘති තුරුලට ගෙන නැලවීම එදා මෙන්ම අද ද ලොව සුලභව දැකිය හැකි ක්‍රියාවලියකි.[3] ඍග්වේදයේ ආදිම සූක්තවලින් පෙනීයන කරුණක් වන්නේ එකල සිටි මිනිසුන්ට ස්වභාව ධර්මයේ ඇතැම් ක්‍රියාකාරකම් බිය හා විශ්මයට හේතුභූත වූ අතර එකී බියමුසු විශ්මය ජනක සිදුවීම් කිසියම් දේවමය බලයකින් සිදුවන බවත්, එම අදෘශ්‍යමාන බලවේගයට පුද පූජා පිරිනැමීමෙන් එකී විශ්මය ජනක කටයුතුවලින් සිදුවිය හැකි හානිය අවම කරගත හැකි බවත් ය. අථර්ව වේදයේ මෙකී අභිචාරවිධි එකින් එකට

---

*ආචාර්ය වසන්ත කේ. දිසානායක, BA, MPhil, (Peradeniya) PhD (Nanjin), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. විද්‍යුත් තැපැල: wasantadisa@yahoo.com

වෙන්වන අයුරු මැනවින් පෙන්වා දී ඇත.[4] ලක්දිව මුල් අවධියේ සිට පැවත ආ මෙකී ඇදහිලි හා විශ්වාස පසුකාලීනව 'දේව මංගල්ල', 'සෙත් ශාන්තිකර්ම' දක්වා වර්ධනය වී එය මිනිසාගේ ජන ජීවිතයේ ඓන්ද්‍රියාංගයක් බවට පත්ව ඇත. කෘෂිකාර්මික රටක් වශයෙන් ලොවපුරා හඳුන්වන ලක්දිව සිංහලයන්ගේ දිවිපෙවත අදටත් රඳාපවතින්නේ ගොවිතැන මත ය.

ශ්‍රී ලාංකේය කෘෂි කර්මාන්තය, විශේෂයෙන් ගොවිතැන ගැන කෙරෙන සාකච්ඡාවක දී නුවරකලාවිය හෙවත් වැව් බැඳි රාජ්‍ය සිහියට නැගෙන්නේ නිරායාසයෙනි. කෘෂි කර්මාන්තයේ නිජබිම රජරට වීම එයට ප්‍රධාන හේතුවයි. යල හා මහ දෙකන්නයේ ම ගොවිතැන් කටයුතුවල යෙදෙන රජරටියාට වැස්ස තරම් දෙයක් තවත් නැත. වැස්ස නිසිකලට නොලැබීම අභාග්‍යයේ ලකුණකි. නියගය කායික මෙන්ම මානසික සන්තාපයකි. තම ජීවනාලිය වන ගොවිතැනෙන්, බතබුලත සරුවන්නේත් අටුකොටු පිරී ඉතිරෙන්නේත් වැස්ස වලාහක දෙවියන් තමන් දෙස කරුණාවෙන් බැලූවහොත් පමණක් බව දන්නා ඔවුන් එදා මෙන්ම අදත් ජලය සලකන්නේ දෙවියකු වශයෙනි. දෙවි දේවතාවුන්ට දක්වන සියලූම පුද සත්කාර වැස්ස වෙනුවෙන් සිදු කිරීමට ගොවියෝ පුරුදු පුහුණු වී සිටිති.

සශ්‍රීකත්වය පෙරදැරි කොටගෙන ලොව බොහෝ රටවල ජනයා විවිධාකාර වූ අභිචාරවිධීන් හි නියැලෙත්[5]. කෘෂි කර්මාන්තය ප්‍රමුඛ ජීවනෝපාය කරගත් ලාංකේය ජන සංස්කෘතිය තුළ ද ඒ හා සබැඳි අභිචාරයන්ට හිමිවන්නේ වෙසෙස් තැනකි. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට පැවත ආ මෙකී අභිචාර, අද්‍යතනයේ ද ඇතැම් ප්‍රදේශයන්හි අවිනෂ්ටව පවතී. ලාංකේය ගැමි සමාජ සන්දර්භය තුළ පවත්නා ගැමි ආගමෙහි වන්දනීයත්වයට සහ පූජනීයත්වයට පත්ව ඇති දේව සමූහයා විෂයෙහි තත් 'ශාන්ති කර්ම' සහ 'දේව මංගල්ල' සිදුකෙරේ. සුවිශේෂත්වය වන්නේ සිංහල බෞද්ධ ජනයා දෙවියන් විෂයෙහි 'දේවමංගල්ල' පුද පූජා පවත්වා ඉන් අපේක්ෂා කරන්නේ ලෞකික මිස ලෝකෝත්තර සුභ සිද්ධිය නොවීමයි.

සශ්‍රීකත්වය මූලික අධ්‍යාශය කරගනිමින් පවත්නා මෙවැනි 'දේව මංගල්ල' ලංකාවේ විවිධ පළාත්හි දක්නට ලැබේ.[6] මංගර දෙවියන් සහ පත්තිනි දෙවියන් මුල්කොට සබරගමු පළාතේ ක්‍රියාත්මක වන 'කිරිමඩු පූජාවත්',[7] 'අලුත් සහල් මංගල්ලය' නිමිති කොට ඒ සබැඳි "දානෙ 'මඩුව පූජාවත්'," උතුරුමැද පළාතේ කනදරා කෝරළයේ [8]. අයියනායක දෙවියන් පෙරටු කොට පවත්නා 'මහා මංගල්ලය', 'මහකිරි ඉතුරුම් මංගල්ලය' හා 'මහාදාන මංගල්ලය' හෙවත් 'ගම්මැදි රාජකාරිය' ආදී වූ මංගල්ලයන් කෘෂි කාර්මික කටයුතු හා කේන්ද්‍රගත ව පවතී. ඒවා නිසි පරිදි ඉෂ්ටකරගැනීමට මෙන්ම, ගවමහීෂාදීන්ගේ ආරක්ෂාව සුභසෙත සැලසූ පළාත්භාර ගම්භාර දේව සමූහයා උදෙසා කෘතගුණ සලකනුවස් අස්වැන්නේ අග්‍රකොටස් දෙවියන් විෂයෙහි පුද දීම මෙහි දී සිදු වේ.

සියලු බෝග වගාවන්ට අවැසි වැස්ස ලබාදී අස්වනු සරුකරවනු ලබන්නේ දෙවියන් විසිනි. එබැවින් ඔවුන්ට මංගල්ල පුද පඬුරු පිළිගන්වන්නේ ඉඳුල් නොවූ අලුත් සහලිනි. 'කිරිහර', 'අළුත්බත් දානය', 'අග්ගස්ස දානය', 'අළුත් සහල් මංගල්ලය', සිදු කරන්නේ දෙවියන්ට කෘතගුණ සැලකීමක් වශයෙනි. ලක්දිව පුරා පැවැත්වෙන මෙම 'අග්ගස්ස දානය' පළාතෙන් පළාතට, ගමින් ගමට වෙනස්වේ. විවිධ වේ. වැව්බැඳි රාජ්‍යයේ නුවරකලාවියේ විවිධ පළාත්වල මෙම දානය

පවත්වන විධික්‍රම වෙනස් වේ, විවිධ වේ[9]. නුවරකලාවියේ හොරොව්පොතාන දිසාවේ, කලවැදි පොතාන ගම්මානයේ පවත්වන මෙම දානමය කටයුත්ත **'ගමේ දාන මංගල්ලය'** නමින් ගම්මු හඳුන්වති. හොරොව්පොතාන ජනශ්‍රැති අධ්‍යයනයක යෙදී සිටින අප පර්යේෂණ මණ්ඩලයට ද මේ දානමය කටයුත්තට සහභාගිවීමේ අවස්ථාව උදාවූ අතර වෙනත් ප්‍රදේශවලට වඩා ක්‍රම හා විධි අතින් මෙම පූජාව වෙනස් වන්නේ කෙසේද යන්න සියැසින් දැකගන්නට ලැබුණු බැවින් ඒ පිළිබඳ ව මෙතැන් සිට විශේෂ අවධානය යොමු කරමු.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කනදරා කෝරළයට අයත් හොරොව්පොතාන ග්‍රාමය කෘෂි කාර්මික ජනතාවක් වෙසෙන ප්‍රදේශයකි. සශ්‍රීකත්වය උදෙසා තත් ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් දෙවියන් විෂයෙහි විවිධාකාර වූ පූජාකර්ම සිදු කරන නමුත් 'ගමේ දාන ගම්බැදි දේවකාරිය' හෙවත් 'ගමේ මහා දාන මංගල්ලයට' හිමිවන්නේ වෙනස් තැනකි.

ගම, වැව, වෙළ, ලන්ද, රක්ෂා කරන්නේත්, රෝගපීඩාදිය දුරුකරන්නේත්, ගව මහීෂාදී සම්පත් වර්ධනය වන්නේත් එයම කරණ කොටගෙන ගමේ සශ්‍රීකත්වය ජනිතවන්නේත් 'ගමේ දානය' වැනි පාරම්පරිකව අඛණ්ඩව සිද්ධකරනු ලබන පූජාකර්ම නිසා බව ගැමියෝ විශ්වාස කරති. මෙකී ගැමි විඥානයට අනුව තත් ප්‍රදේශයේ පවත්නා ගම් තුලාන සියල්ලක් ම පාහේ දෙවියන්ගේ ඇල්ම බැල්ම නිරන්තර ලැබ දෙන්නා වූ පාරම්පරික ග්‍රාමයන් ය. අතීත මුතුන්මිත්තන්ගේ සිට පැවතෙන්නා වූ මෙම දේව වන්දනය අදටත් හොරොව්පොතාන ප්‍රදේශයට අයත් ගොදුරු ග්‍රාමයන්හි දක්නට ලැබේ. ගමට, වැවට, වෙලට, අරක්ගත් ගම්භාර දෙවියන් සිටින බවත් ඔවුන්ගේ පිහිට ආරක්ෂාව ආශිර්වාදය පතා කන්නලව් කිරීම්, යැදීම් හේතුකොට ගෙන තමන් වෙත එම දේව අනුහස ලඟාවෙන බව ගැමි ජන ආකල්පයයි. එපමණක් නොව, ඒ තුළින් ගමට, වැවට, වෙළට යහපත සශ්‍රීකත්වය උදාවන බවත් මේවා ආරක්ෂාකරදුන් ගම්භාර දෙවියන් විෂයෙහි කෘතගුණ සලකනු වස් අස්වැන්නේ අග්‍ර කොටස ගෙන අඩුක්කු පුදා යහන් දී දාන මංගල්ල සිදුකිරීමට සමස්ත ගැමි ජනතාවගේ සහභාගිත්වය ලැබේ.

හොරොව්පොතාන ප්‍රදේශයේ ගොදුරු ගම් සියල්ල ම පාහේ සහභාගි වන්නා වූ 'ගමේ දාන මංගල්ලය' සඳහා සූදානම් වන්නේ අස්වනු කපා පාගා අවසන් වූ පසුවයි. මීට ප්‍රථම ඉතා දීර්ඝ වූ ද, කලක් සුරැකි සංකීර්ණ වූ ද පූජාවිධි සහ අභිචාර ක්‍රමයන්ගෙන් සුසැදි වතාවත් රාශියක නියැලීම විශේෂ ලක්ෂණයකි. මෙකී සියලු පූජා කර්මයන් මූලික අධ්‍යාශය සමඟින් ඓන්ද්‍රීයව බැදී පවතින බව අවධාරණයෙන් සඳහන් කළ යුතු ය.

තත් ක්‍රියාදාමයේ මුල් ම දේවකාර්යය වන්නේ **පනම් බැදීමයි** (ඡායාරූපය 01 බලන්න). නැකත් රාල විසින් සුදුසු නැකත් බලා නියම කරගත් පරිදි වප් මාසයේ මාස්කන්නයට පෙර දී සිදු කළ යුතුය.[10] නැකත්රාළට ගමේ හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. වැස්ස වලාහක දෙවියන්ගේ ඇල්මබැල්ම ලබාගනු වස් සිදුකරනු ලබන පනම් බැදීම තුළින් මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ සුදුසු කල්හි වර්ෂාව ලැබ වැව පිරී ඉතිරියාමයි. උතුරු මැද පළාතේ කෘෂි කාර්මික කටයුතු සිදුකරන්නේ වර්ෂා ජලයෙන් සුපෝෂිත වැව් පදනම් කරගෙනයි. වැව් රජරට වැසියන්ගේ ආත්මය වන්නේ මෙබැවිනි. ගැමියන් වර්ෂාවට අධිගෘහිත දෙවියන් ලෙස සලකන්නේ පනම් කුමාරයා ය.

වැව්බැඳි රාජ්ජේ "පනම් කුමාරයා" ලෙස හඳුන්වන ගොවිතැන්බත් සරුකරන දෙවියන් යුරෝපයේ හඳුන්වන්නේ "ශස්‍යමාතෘ ශස්‍යදුහිතෘ" යන නමිනි. ශස්‍යමාතෘ දේව මංගල්ලයේ දී කෙනෙකුගේ පිටෙහි ගොයම් මිටියක් බැඳ, බෙර වයමින්, ගී කියමින් කමත වටා පෙරහැරින් ගෙනයමින් දෙවියන්ට පුද පූජා පවත්වති. මෙම මංගල්ලය James George Fraser මධ්‍යකාලීන යුරෝපයේ පැවැත්වෙන මේ පෝල් නැටුම්වලට (May – Pole Dance) සමාන බව එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අදහසයි.[11]

මෙකී පනම් බැඳීමේ දේවකාර්යය, දේව මංගල්ලය ගමේ කපුරාළ, ගමරාළ, අනුමැතිරාළ ගම්වැස්සන් සහ ඇලපත් ඇති සියලු දෙනාගේ ද සහභාගීත්වයෙන් යුක්තව සිදුකළ යුතුය. වැවේ මුට්ටි නැමුම් මංගල්ලය සිදු කරනු ලබන ස්ථානයේ දී ම පනම් කුමාරයා වෙනුවෙන් බුලත් 21 පුවක් 21 තබා යහන් දෙනු ලබන්නේ පෙරදින සැන්දෑ යාමේ දී ය. එය ගමරාළ සහ අනුමැතිරාළගේ කාර්යයකි. පසුවදා උදෑසන කහ කැටේ ඉර පායන කලට (අලුයම 5.30 ට පමණ) ගමරාළ වැවේ ඇති නැවුම් ජලයෙන් ස්නානය කොට, පවිත්‍රවී, සුදු පිරුවට ඇඳ මුණ්ඩාසනයක් බැඳ පේවී උදෑසන දේවකාර්යය සඳහා සූදානම් වේ. බෝල්පනා අත්තක් රැගෙන මයිල පටියකින් වෙලා එය මුට්ටි නමන ස්ථානයේ සවි කරන ගමරාළ විසින් එයට රන් පනමක් ගැට ගසනු ලබයි. අනතුරුව බෝල්පනා අත්ත තමා දෙසට නමා ගනිමින් පනම් කුමාර දෙවියන් සඳහා කානාකාරිය කියනු ලැබේ.

"...අවසර... අවසර... පස්වාන් දහසකට අය්යනා බණ්ඩාර පනම් බණ්ඩාර, ගලේ බණ්ඩාර, වැවේ බණ්ඩාර, රත්තරං බණ්ඩාර, කඩවර බණ්ඩාර තමුන්නාන්සේලා වැවට ගමට වෙලට යහතින් දිවස්හෙලා බැල්මලා වදාරන මහා සත්‍යානුභාවයට... ඇතුන් බැන්ද වූ රන්පනමට, රිදී පනමට, උඩිරිප්පුවට බැල්ම කර වදාරා පනම් බණ්ඩාර හාමුදුරුවනේ ඔබවහන්සේ වැස්ස වලාහක දේවතාවන්ට අණසක පතුරුවා වැව පුරවා සකල ඓශ්වර්ය සෞභාග්‍ය පතුරුවන්නට ආයුබෝ වේවා, අයුබෝ වේවා..." (පනම් කුමාර කන්නලව්ව)

කානාකාරිය නැතහොත් දේව කන්නලව්ව කියමින් 'ගමේ දාන මංගල්ලය' 'කිරි ඉතිරුම් මංගල්ලය' සඳහා භාරහාර වෙමින් සියලු දෙවිදේවතාවුන්ට අඬගසා කොළ මිටිය සහිත බෝල්පනා අත්ත අතහරිනු ලබයි. ඒ සැණින් කැප්තුවක්කුව භාවිත කරමින් වෙඩිල්ලක් තබනු ලබයි. එය පූජා වෙඩිල්ල නමින් හැඳින්වේ. මෙහි සුවිශේෂත්වය වන්නේ පූජා වෙඩිල්ල ජලයේ ගෑවී නොගෑවී යන පරිදි සිදු කිරීමත්, ඒ හේතුකොට ගෙන ජලය රැල්ලක් ආකාරයකින් ඉහළට එසවීමත් ය. මෙකී කර්තව්‍යය සඳහා එක්රොක්වී සිටින ගැමියන්ගේ සිතට සැනසුම් සුසුමක් සේ ම චිත්ත ධෛර්යක් ඇතිවීමට ද මෙය ඉවහල් වන බව ඔවුන්ගේ විශ්වාසයයි. එබැවින් ඔවුන් පවසන්නේ 'වැහිගම්පොළයා මේ පාරත් අපි දිහා බැලූවා' යනුවෙන් සඳහන් කරමිනි. පනම් බැඳ දින හතකින් වර්ෂාව ලැබේ.

යුද්ධයට පිටත්වීමට පෙර අනුකරණාත්මක නැටුම්වලින් යුද්ධයක් නිරූපණය කිරීම අදත් වැදි ජනතාව අතර පවතින අභිචාර විධියකි.[12] ගොයම සරුවට වැඩීමට කුඹුර ළඟට ගොස් උඩ පැනපැන නැටීම යුරෝපයේ පවත්නා එවන් තවත් අභිචාරාත්මක චාරිත්‍රයකි. සිය ස්වාමිපුරුෂයන් යුද්ධයට ගිය පසුව ඔවුන්ගේ භාර්යාවරු ද සුළු වස්ත්‍රයෙන් සැරසී කැති පොරෝ රැගෙන ගස්ලබු

ගෙඩිවලට කොටා දෙපලු කරති. යුද්ධයේ දී සතුරු පිරිස්වල ඔලු ගෙඩි පැලීම එමගින් අනුකරණය කරන අතර, එසේ කිරීමෙන් යුද්ධයේ දී තමන්ගේ ස්වාමිපුරුෂයන් ජයග්‍රහණය කරන බව ඔවුහු තරයේ ම විශ්වාස කරති.[13]

'වැහි පොළගා' හෙවත් වැස්ස වළාහක දෙවියන් තමන් දෙස බලා දින හතක් ඉක්මවීමට පෙර වැව පිරී ගොවිතැන්බත් සරුකර ගැනීමට අවැසි ජලය ලබාදෙන බව ගැමියෝ විශ්වාස කරති. වැස්ස නැතවුවහොත් සිදුවන්නේ මහ වින්නැහියකි. අක්වැහි දිගින්දිගට ම නොලැබෙන නිසා 'හරි හමන් කාලෙට මහවැසි කරරියොත් ඉඩැල්ලේ පාන්ඩුවෙලා බවබෝග උන් පොළට කරංගැටියා වී වස වින්නැහියක් වෙන්ඩ බැරි නැත.'[14]

බෝග සරුවී අස්වැන්නෙන් අටුකොටු පිරී ඉතිරෙන්නේ නිසිකලට වැසි වැස්සොත් පමණි. වැව් ඉස්මත්තේ පනම් බැද, පනම් දෙවියන්ට භාරහාරවී අයැද සිටින්නේ, වැහි වස්සවා වැව පුරවා දෙන ලෙසටයි.

මින් අනතුරුව ගොඩමඩ දෙකෙහි වැඩ ආරම්භ කරන ප්‍රදේශවාසීහු වැස්ස පමණක් ප්‍රමුඛ කර ගනිමින් කැකුළන් ඉසීම සිදු කරති. කැකුළන් ඉසිනවා යනු වැසි ජලය මුල් කරගනිමින් සිදු කරන වී වැපිරීමයි. අනතුරුව නියමාකාරයෙන් සිදු කරනු ලබන කුඹුරු ගොවිතැන් පටන් ගනී. වී ගොවිතැන ට අමතරව ගොඩ හෙවත් හේන් ගොවිතැන ද සිදුකරන අතර සියලුම කෘෂි කටයුතු එක ම කාල සීමාවක දී සාමූහිකව සහයෝගයෙන් යුක්තව සිදුකොට නිමාවට පත්කරනු ලබයි. මේ සඳහා මූලිකව කටයුතු කරනු ලබන්නේ ගමරාළ, විදානේරාළ, බද්දෙරාළ, ලේකම, වැව් ලේකම ආදී ග්‍රාමයෙහි ප්‍රභූ පිරිස විසිනි. සියලුම වෙලේ රාජකාරී එක ම කාලසීමාවක නිමා කරන මොවුහු, සොබාදහම අවනත කරදුන් දේව සමූහයා කෙරෙහි කෘතගුණ සලකනුවස් තම නොඉඳුල් බෝගයන්ගේ අග්‍රකොටස අග්‍රශස්‍ය හැටියට ගෙන භාරහාර ඔප්පු කිරීම සිදු කරති.

කුඹුරේ ගොයම් පැසුණු කළ සියලුම ගොවියන් කරල් මිටක් කපාගෙනවිත් යහලේ තබන්නේ තම භෝගයන්ගේ අග්‍ර කොටස දෙවියන්ට පුදදීම උදෙසා ය. මුල් ම කොටස් අග්‍ර ශස්‍ය දානය වෙනුවෙන් වෙන් කරන ඔවුහු, අදාළ ග්‍රාමයෙහි පන්සලක් පිහිටියේ නම් මුල් සහල් කොටස විහාර මංගල්ල සඳහා ද දේවාල ග්‍රාමයක්නම් දේව මංගල්ල වෙනුවෙන් ද කැප කර තබති. මෙසේ දෙවියන් වෙනුවෙන් වෙන්කරන ලද සහල්වලින් ගමේදාන මංගල්ලය පවත්වනු ලබයි. ගමරාළ කපුරාළ ඇනමිට්රාළ (අනුමැතිරාළ) ඇතුළු ගමේ ප්‍රභූ පිරිස එකතු වී දාන මංගල්ලය පැවැත්වීමට සුදුසු දින නියම කර ගනිති. දින නියම කිරීමෙන් අනතුරුව ගම් වැසියන් සතියක් මුලුල්ලේ පෙහෙවස් විය යුතුය. මෙකී කාලය තුළ මහාකැලේ යාමක්, මස්මාංශ අනුභව කිරීමක් නොකරන ගැමියා තෙල් වළං ලිප තැබීමක් ද නොකරයි. දෙවියන් විෂයයෙහි පවත්නා ගැමියාගේ අව්‍යාජ ගෞරවය ඉන් විශද වේ. ඉදිරියේ දී සිද්ධ කරනු ලබන දේව මංගල්ලයට පෙර සූදානම නැත හොත් ජේවීම මේ අයුරින් සිදු කරන ගැමියා ගම් තුලානේ සියලුම නිවෙස්හි පංගුපේරුකරුවන් දෙවියන් සඳහා කැප කොට ඇති මුල් ම සහල් කොටස්, බුලත්පුවක් ඇතුළු අනෙකුත් අවශ්‍ය දෑ ගම් වැසියන්ගෙන් එකතුකර ගනියි.

මෙම මහා දාන මංගල්ලය, සිදු කරන්නේ ගම් තුලානේ පොදු ස්ථානයක ය. එය පට්ටිය දේව අඩවිය නමින් හැඳින් වේ. අප අධ්‍යයනයට ලක් කළ කිඹුල්පැටියාව ග්‍රාමයේ ගමේදාන

මංගල්ලය සෑම වසරක ම සිදු කරන්නේ විශාල ඇසතු රුකක් පාමුල පුරාතන කිඹුල්පැටියාව ග්‍රාමයේ මුල් ම නිවාස පිහිටි ස්ථානයේ ය. අදාළ දිනයේ දී ගමේ සියල්ලෝ ම එකතු වී ස්ත්‍රී, පුරුෂ වශයෙන් බෙදී මෙකී දාන මංගල්ලයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරති. පළමුව අදාළ ස්ථානය බොල්පනා අත්තකින් ඇමැ ද කහ දියර ඉස පවිත්‍ර කොට, පට්ටියේ කතරගම දෙවියන් උදෙසා රජගෙය නොහොත් යාලත්තක් බැම සිදු කරයි. (ඡායාරූපය 02 බලන්න) රජගෙය සකස් කිරීමට කිසිදු කෘතිම අමුද්‍රව්‍යයක් යොදා නොගන්නා ගම්මු කොහොඹ ගසක් පාමුල ස්වභාවික අමුද්‍රව්‍ය වන පොල් අතු, ලී, වැල් යොදා සකස් කිරීමට වගබලා ගනිති.

කතරගම දෙවියන්ගේ රජගෙය හෙවත් යාලත්ත තුළ පුල්ලයාර් දෙවියන්ගේ සංකේතයක් තබනු ලැබේ. පුල්ලෙයාර් උතුරුමැද පළාතේ බලසම්පන්න දෙවියෙකි. සියලු පූජා කර්මයන්හි ඔහුට පුද පූජා පැවැත්වීම අනිවාර්ය අංගයකි. නමුත් මේ රජගෙය සකස් කරන්නේ කතරගම දෙවියන් උදෙසා විමානයක් වශයෙනි. ගමේදාන මංගල්ලයේ දී කතරගම දෙවියන් ප්‍රමුඛ කොට අයියනායක, පුල්ලෙයර්, ගම්භාර වැවේ දෙවි, වන්නියේ දෙවි ආදී දේව සමූහයා ම පුද පූජා ලබති.[15]

'ගමේ ගමරාළගේ අවවාද උපදෙස් අනුව පිරිමි පක්ෂය පමණක් සහභාගිවී සකස්කරන ලද යාලත්ත තුළ පුරුෂ පක්ෂය විසින් ම කතරගම දෙවියන් ප්‍රමුඛ අනෙක් දෙවිවරුන් උදෙසා කිරි උතුරවා කිරිබතක් පිසිනු ලබයි. එය 'රජ හැලිය' නමින් හඳුන්වනු ලැබේ. (ඡායාරූපය 03 බලන්න)

'රජ හැලිය' විචිත්‍ර ලෙස සකස්කරනු ලබන්නේ හුණු සහ කහ මිශ්‍ර කොට සාදා ගන්නා සායම් වර්ගයකින් සිත්තම් කරමිනි. අනතුරුව බුලත් කොළ 4 ක් ගෙන 'රජ හැලිය' වටා ගැට ගසයි. මින් පසු ගමරාල විසින් කහදියරින් පිරිසිදු කරන ලද පිරුවට එළන බිම, පුවක්, බුලත්, වී සහ පොල් ගෙඩියක් තබා ඒ මත 'රජ හැලිය' තබා පේ කර තුන් අවුරුද්දක් සඳහා ගොවිතැන් සියලු සතුරු බලවේගවලින් ආරක්ෂා කර දෙන ලෙසත්, ගම්මුන් වඳුරු වසංගතයන්ගෙන් බේරා සශ්‍රීකත්වය ඇති කොට ගමේ සෙත් ශාන්තිය ඇති කරදෙන ලෙසත් දෙවියන්ගෙන් අයදිමින් දේව සමූහයා සිහිකොට එය තුන් යලක් කරකවා ලිප මත තබයි.

කිරි ඉතිරවූ පසු එවෙලේ ම දෙවියන් උදෙසා වෙන් කරන ලද, ගම් වැසියන්ගෙන් එකතු කරගත් සහල් 'රජහැලියට' දමා මිශ්‍ර කොට පැන් නුමුසු කිරි බතක් පිස ගනී. තත් දේවකාර්ය සිදු කරනු ලබන්නේ පුරුෂ පාර්ශවය විසිනි. 'රජ හැලිය' සහල් දමා ලිප තැබීම ගමරාළගේ ප්‍රධානත්වයෙන් සිදුවේ. (ඡායාරූපය 04 බලන්න)

කතරගම දෙවි ප්‍රමුඛ කොට සමස්ත දේව සමූහයා වෙනුවෙන් කිරි උතුරුවා කිරිබත 'රජ හැලියේ' පිසෙද් දී ඊට සමගාමීව පුල්ලයාර් දේව කාර්යය සිදුකෙරේ. එය ගැමියන් හඳුන්වන්නේ 'පුල්ලෙයාර් මඩය' නමිනි. 'පුල්ලෙයාර් මඩය' පහත සඳහන් පූජා ද්‍රව්‍යවලින් යුක්ත ය. (ඡායාරූපය 05 සහ 06 බලන්න.)

1. වී ලාහයි (සේරු හතක්)
2. පොල් ගෙඩියයි
6. රත්මල්
7. දෙකට බිඳින ලද පොල් ගෙඩියක්
11. සුළු පිරුවටයක්

3. හාල් සේරුවයි
4. පුවක් හතයි
5. බුලත් හතයි
8. දුම්මල අල්ලච්චියක්
9. සෙම්බුවක්
10. පන්දම් පහන්

ගමේ දාන මංගල්ලය කතරගම දෙවියන් මුල්කොට පුදනු ලැබුව ද පුල්ලෙයාර් විශේෂයෙන් රජරට ප්‍රදේශයට අධිගෘහිත බලසම්පන්න ප්‍රාදේශීය දෙවිවරයා වන බැවින් ඔහු ගම්මුන්ගේ විශේෂ පුදසත්කාරයට භාජන වේ.

'රජ හැලිය' පුරුෂ පාර්ශවය විසින් ලිප තැබූ පසුව පට්ටියට එක්රැස්වූ කාන්තාවෝ පැමිණි සිටින පිරිස සඳහා දානය සකස් කිරීම ආරම්භ කරති. මේ සඳහා හේන් අස්වැන්නේ අග්‍ර කොටස යොදා ගැනීම විශේෂ ලක්‍ෂණයකි. මෙහිදී වට්ටක්කා ව්‍යංජනයක්, අඟුණුකොළ මැල්ලුමක්, සහ කිරි හොද්දක් සකස් කෙරේ. හේන්වල මුල් ම අස්වැන්න මේ අයුරින් දෙවියන් වෙනුවෙන් කැප කරන ගොවියා වට්ටක්කා "උලන්ගුවේ වට්ටක්කා" නමින් හඳුන්වන අතර අගුණකොල මැල්ලුම, "දෙවියන්ගේ ආහාරයක්" ලෙස සලකන අතර ඔව්හු එය දාන මංගල්ලයට අත්‍යවශ්‍ය අංගයක් කොට සලකති. (ඡායාරූපය 07 බලන්න)

'රජ හැලිය' සහ අනෙකුත් ව්‍යංජන පිස නිමවූ කළ සිදු කරනු ලබන දේව කාර්ය වන්නේ පුල්ලෙයාර්, අයියනායක, කඩවර, ගම්භාර දෙවියන් විෂයෙහි ගොටු දීමයි.

පුරාණයේ සිට පැවත එන වෘක්ෂයක් අසලට යන ගමරාළ සහ කපුරාළ පිහියක් සහ පන්දම් දෙවියන් වෙනුවෙන් කැප කළ ගොටු ද රැගෙන පුල්ලෙයාර් සහ අයියනායක දෙවිදුන් උදෙසා පූජා පවත්වති. දෙවියන්ට යාඥාකොට යාතිකා ගයා දෙතුන් වතාවක් පැන් වත්කොට පේ කොට පිරිසිදු කරන ලද පිහියෙන් ගසට කොටා ගොටුදීමේ පූජාව හමාර කරති. ගමට බලපාන්නා වූ අණවින, බන්ධන, වසංගත සියල්ල දූරීභූත වී ධන ධාන්‍යවලින් ආඪ්‍යවීමට දෙවියන්ගේ ඇල්ම බැල්ම ආරක්‍ෂාව මෙන්ම ආශිර්වාදය ලබා ගැනීම මෙමගින් අපේක්ෂිත අරමුණයි. මෙකී දේව කාර්ය සිදු කරන්නේ ගමරාලගේ මූලිකත්වයෙනි. (ඡායාරූප 08 සහ 09 බලන්න)

දෙවියන් අරබයා ගොටු දීමෙන් පසු තත් දේව මංගල්ලයට සහභාගි වූ සියලුම ගම්තුලානේ වැසියනට කතරගම දෙවියන් සිහිකොට ගමරාළ විසින් ආශිර්වාදාත්මක "පරහඳ" ගානු ලබයි. (ඡායාරූපය 10 බලන්න)

දේව කන්නලව්ව හා දේවකාර්යයන් සඳහා ගමේ දානයට ගමේ දෙවියන් පට්ටියට වැඩම කළ යුතු ය. පෙරහරින් ගරු ගාම්භීර ලෙස ගමේ දෙවියන් දේව භූමියට දේවාභරණ සහිතව වැඩම කරවා දේවපූජා සිදුකළ යුතු ය. සියලුදෙනා ආහාර අනුභවය සිදුකළ යුත්තේ දෙවියන් වැඩමවා දේවපූජා සිදු කිරීමෙන් පසුව ය.

'පරහඳ' ලබාගැනීමෙන් පසු පැමිණි සිටින සියලු දෙනා පට්ටියේ පැඳුරු එළා බිම හිඳ ලක ලැහැස්ති වන්නේ දේව දානය පිළිගැනීමට ය. එය ලබාදෙන්නේ නෙළුම් කොළවලට ය. තත් සත්කාර්ය හමුවේ පවා ගැමියා අනුගමනය කරන චාරිත්‍ර රැසකි. ගමේ ප්‍රභූ පිරිස වන

දැණමිතිරාළ, කෝරාළ, රටේරාළ, බද්ධරාළ, වැව්ලේකම මෙන්ම වෙනත් පිටස්තර ප්‍රභූන් අරඹයා සුවිශේෂ ගරු සැලකිලි පිරිනැමීමට ගැමියෝ මෙහි දී අමතක නොකරති. එහි ප්‍රභූ පිරිස් සඳහා තට්ටුවේ බුලත හෙවත් පෙට්ටියේ බුලත පිරිනමති. තට්ටුවේ බුලත යනු ඉලත්තට්ටුවක් මත නෙළුම් කොළයක් තබා ඒ මතට දානය පිළිගැන්වීමයි. පෙට්ටියේ බුලත යනු පන්වලින් සකසන ලද පෙට්ටියක් ගෙන එය මුනින් අතට නවා ඒ මත නෙළුම් කොළය තබා දානය පිළිගැන්වීමයි.

ප්‍රභූ පිරිස අරබයා මුලින් ම දානය පිරිනමා අනතුරුව රැස්ව සිටින සියලු දෙනාට දානය පිරිනමයි. පළමුව කතරගම දෙවියන් උදෙසා සැකසූ 'රජ හැලියේ' කිරිබත් රැස්ව සිටින පිරිසට පිළිගන්වා අනතුරුව අනෙකුත් ආහාර පිළිගන්වති.

මේ අතරතුර තවත් සුවිශේෂ කාර්යයක් සිදු වෙයි. එනම්, කතරගම දෙවියන්, කඩවර දෙවියන්, ගමේ බූමාටු දෙවියන්, වෙලේ බණ්ඩාර දෙවියන් ආදී සමස්ත දේව සමූහයා මූලික කර ගනිමින් පුද දෙන මේ දාන මංගල්ලයේ දී, භූත ප්‍රේත ආදීන්ගේ ද නියෝජනයක් දක්නට ලැබීමයි. ආහාර අනුභවයට පෙර නෙළුම් කොළයක් රැගත් ගැමියකු විසින් පිරිනමන ලද ආහාර කොටස් එකතු කරනු ලබන්නේ මෙකී අදෘෂ්‍යමාන බලවේග නිමිති කොටගෙන ය.

පැමිණ සිටින සියලු දෙනා හට ආහාර පිළිගන්වා නිමවීමෙන් පසු ගමරාළ විසින් දානය නම්බු කළ යුතු ය. නැතිනම් ආදරය කළ යුතු ය. ගමරාළ දානය නම්බු කරන තෙක් කිසිවකුට ආහාර අනුභවයට ඉඩ ප්‍රස්ථාවක් නැත. ඔහු දෑත් එක්කොට සියලු දෙනාට ආචාර සමාචාර කළ යුතු ය. ඉන් ගම්‍යවන්නේ දානය භුක්ති විඳීම සඳහා අවසර දීමයි. කපුරාළට දානය පිළිගැන්වීම ගමරාළ විසින් සිදුකළ යුතු අනිවාර්ය චාරිත්‍රයකි. කපුරාළගේ සම්පත් දායකත්වයට එමගින් කෘතගුණ සැලකේ. (ඡායාරූප 13 සහ 14 බලන්න)

බුදුන් දවස සිට අද දක්වා ම සංඝ සංස්ථාව ද මේ උතුම් සත්කාර්ය සිදු කරනු දැකිය හැකිය. එහි දී නායක භික්ෂූන්වහන්සේගෙන් අනුමැතිය අවසරය ලැබෙන තුරා දානය වැළඳීමෙන් වැළකී සිටින අතර අවසර ලැබීමෙන් පසුව සියලුම දෙනා එකවිට දානය පිළිගැනීම විශිෂ්ටතම ලක්ෂණයකි. මෙම සත්කාර්යය කිඹුල්පැටියාව ග්‍රාමයේ පැවැති ගමේ දාන මංගල්ලය තුළ ද අන්තර්ගතව පැවති අතර එයින් ගම්‍යවූයේ ද සාමූහිකත්වය පිළිබඳ සංකල්පයයි. ගමේ දාන කටයුත්ත සඳහා ගම් තුලානේ කණවැන්දුම් ස්ත්‍රීන් පවා සහභාගිවීම අනිවාර්ය වේ. ගම්තුලානේ ජීවත්වන්නන් අතර කුමනාකාරයේ සිත් අමනාපකම්, නොහොඳ නෝක්කාඩු, කුලමල භේද පැවතිය ද මෙම දේව මංගල්ල දිනයේ දී ඒ සියල්ල අමතක කොට සාමූහිකව කටයුතු සිද්ධ කළ යුතු ය. සියලුම ගම් වැසියන්ගේ දායකත්වයෙන් යුතුව සිද්ධ කරනු ලබන මෙම දේව මංගල්ලයට කිසියම් ගම් වැසියෙක් සහභාගී නොවන්නේ නම්, ඔහු හෝ ඇය ගමේ සියලු වැදගත් කටයුතුවලින් ඉවත්කරනු ලබයි. එවන් පුද්ගලයන් හිර තියපු අය ලෙස ගැමියෝ හඳුන්වති. ගමේ ගැමියන් සමග දොඩමළු වීම, ආවාහ විවාහ කටයුතුවලට සම්බන්ධවීම ආදී කිසිවකටත් හිරතියපු තැනැත්තාට සම්පූර්ණයෙන් තහනම්වේ. ගමේ ගැමි නීතිය රජයේ නීතිය පරයන්නේ මෙවන් අවස්ථාවල දී ය.

මෙවැනි සාමූහික පූජා විධි හේතුවෙන් සමස්ත සමාජ සන්දර්භය තුළ පවත්නා ඒකාබද්ධතාව ප්‍රබල ලෙස තහවුරුවනු දක්නට ලැබේ. මෙවැනි වූ අභිචාර විධි ගමේ අනාගත අභිවෘද්ධිය සඳහා සෘජුව ම බලපායි. සාමූහිකත්වය ගමේ ජීවයයි. ශක්තියයි. සෞභාගයේ ඒකායන මාවත සාමූහිකත්වයයි. සියලු කටයුතු සුදුසු කල්හි සිද්ධ කිරීමට සියලුම දෙනා කැපවන මෙවන් අභිචාර, ගමට පමණක් නොව සමස්ත රටට ම ආශිර්වාදයකි. අභිචාර විධි හුදු ආගමික චාරිත්‍රයක් හෝ සංස්කෘතික කාර්යයක් නොවන්නේ මෙබැවිනි. තව ද මනුෂ්‍ය චිත්ත සන්තානගතව පැලපදියම්ව පවත්නා බිය සැක මුසු ව්‍යාධීන් ද පළවා හැර කිසියම් වූ දුෂ්කර කාර්යයක් සඵල කර ගැනීමට අවශ්‍ය චිත්ත ධෛර්යය, වීර්යය සහ විශ්වාසය ගොඩනැගීම තුළින් ජයග්‍රහණයේ දොරටු විවෘත කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතුව ඇත.

## සටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය පර්යේෂණ කමිටුව විසින් අනුමත කරන ලද "හොරොව්පොතාන ජනශ්‍රැති පර්යේෂණ" නම් වූ පර්යේෂණය යටතේ හොරොව්පොතාන පරිපාලන ප්‍රදේශයට අයත් ඓතිහාසික ගම්මාන කිහිපයක් තෝරාගෙන සිදුකරන සමාජ. මානව විද්‍යාත්මක ගවේෂණයෙහි දී කිඹුල්පැටියාව නම් වූ පිටිසර ගම්මානයෙන් පවත්වන ලද 'ගමේදානය' උතුරුමැද ජනයා තුළ ඇති බහුවිධ අභිචාර ක්‍රමවලින් අංශු මාත්‍රයක් පමණි.

මේ පර්යේෂණයට අවශ්‍ය පසුබිම ගම තුළ සංවිධානය කරමින් ගමට රටට අනල්ප සේවයක් සිදුකරන හොරොව්පොතාන මහා විද්‍යාලයේ උප විදුහල්පති වජිර දිසානායක මහතා සහ එම පවුලේ සැමගෙන් අප පර්යේෂණ කණ්ඩායමට ලැබුණු නොමඳ සහාය මෙහිදී සිහිකරන්නේ කෘතඥතා පූර්වක ගෞරවයෙනි. ඔහු ගැමිකමට ලැදි සැබෑ ම සත්පුරුෂ ගැමියකි. ඔහු නොවන්නට මේ පර්යේෂණයේ සාර්ථකත්වයක් දැකිය නොහැකිවන්නේ ය.

මෙම පර්යේෂණ කටයුත්තේ දී කඳුහෙල් තරණය කරමින් මා සමඟ අත්වැල් බැදගෙන දිවාරාත්‍රී එකසේ වෙහෙසෙමින් කරුණු රැස්කරමින්, පටිගත කරමින්, ඡායාරූප ගනිමින්, ගම්මුන් සමඟ සාකච්ඡා කරමින් මට සහාය දැක්වූ හර්ෂණී මිල්ලගහතැන්න, චමිලා විජේවර්ධන, ඉන්දික ඉහළගෙදර අජිත් තලවත්ත යන ආචාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ටත්, සම්පත් දිසානායක, බාලසූරිය යන රජරට විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ටත් හොරොව්පොතාන පරිපාලන ප්‍රදේශයේ ගම්මානවල සියලු ගම්වැසියනටත් ගෞරවනීය ස්තුතිය මෙයින් පරිනමමි.



ඡායාරූපය 01 - වැලිමුවපොතාන වැව අද්දර පනම් බැඳ ඇති පනම්ගහ



ඡායාරූපය 02 - කතරගම දෙවියන්ගේ රජගෙය



ඡායාරූපය 03 - රජහැලිය පේ කිරීම හා විසිතුරු කිරීම



ඡායාරූපය 05 - කිරි ඉතිරවීම




ඡායාරූපය 04 - රජ හැලිය සහල්දමා ලිප තැබීම



ඡායාරූපය 06 - පුල්ලයාර් මඩය



ඡායාරූපය 07 - වට්ටක්කා කිරිහොදි
අගුණුකොළ මැල්ලුම සකස් කිරීම



ඡායාරූපය 08 - ගොටු දීම



ඡායාරූපය 09 - පේ කරන ලද පිහියෙන්
ගසට කෙටීම



ඡායාරූපය 10 - රෝග නිවාරණ ආශිර්වාද
පරහඳ ලබා ගැනීමට ගම්මුන් එක පෙළකට
ගමන්කිරීම



ඡායාරූපය 11 - පට්ටියට/දේවභූමියට
දෙවියන් වැඩම කරවීම



ඡායාරූපය 12 දානය නම්බු කිරීම



ඡායාරූපය 13 - දානය අනුභව කිරීමට උපදෙස් ලැබෙන තුරු සියලු දෙනා බලා සිටින අයුරු



ඡායාරූපය 14